RARE

# ශ්‍රී ලංකාවේ පවුල් සංස්ථාව තුළ
# මව විදෙස් ගතවීම
# දරුවන් කෙරෙහි බලපා ඇති ආකාරය පිළිබඳ
# සමාජ විද්‍යාත්මක අධ්‍යයනයක්

(කුරුණෑගල මල්ලවපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇසුරෙනි)

ඩබ්ලිව්.පී. රසිකා විජේනායක

**FGS/SOCI/MC/11/001**

සමාජීය විද්‍යාපති උපාධියෙහි අවශ්‍යතාවයක් පූරණය කරනු පිණිස

කැලණිය විශ්ව විද්‍යාලයේ පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය වෙත

ඉදිරිපත් කෙරෙන පර්යේෂණ නිබන්ධනයකි.



| | |
|---|---|
| ප්‍රවේශ අංකය: | 1281 |
| වර්ග අංකය: | |



ජනවාරි 2016

## නිබන්ධන සාරාංශය

ශ්‍රී ලංකාවේ පවුල් සංස්ථාව තුළ මව විදෙස්ගත වීම දරුවන් කෙරෙහි බලපා ඇති ආකාරය පිළිබඳ සමාජ විද්‍යාත්මක අධ්‍යයනය සිදු කිරීමේ දී පර්යේෂණ ගැටළුව වූයේ පවුල් සංස්ථාව තුළ මව විදේශගත වීම දරුවන්ට බලපාන්නේ කෙසේද කියායි. මෙම ගැටළුව අධ්‍යයනය සඳහා අධ්‍යයන ක්ෂේත්‍රයක් තෝරා ගත යුතු වූ බැවින් කාන්තා ශ්‍රමිකයින් ඉහළ ප්‍රතිශතයක් විදේශගතව ඇති ප්‍රදේශයක් වූ මල්ලවපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තෝරා ගත් අතර මෙම කොට්ඨාසයේ සියලුම ග්‍රාම නිලධාරි වසම් නියෝජනය වන පරිදි මව විදෙස්ගත වූ පවුල් ඇතුළත් අහඹු නියැදියක් තෝරා ගන්නා ලදී. එම නියැදිය තුළ මව විදෙස්ගත වීම නිසා දරුවන් රැකබලාගත් භාරකරුවන් සහ එම පවුල්වල දරුවෝ දත්ත දායකයෝ වූහ. ප්‍රශ්නාවලිය දත්ත රැස්කිරීමේ ප්‍රධාන ශිල්ප ක්‍රමය වූ අතර ඒ තුළින් සංඛ්‍යාත්මක තොරතුරු ලබා ගන්නා ලදි. දරුවන් හා සුහදශීලීව සිදුකළ සම්මුඛ සාකච්ඡා තුළින් දත්ත තහවුරු කර ගන්නා ලදි. සෘජු නිරීක්ෂණය ද දත්ත එක්රැස් කිරීමේ ශිල්ප ක්‍රමයක් වූ අතර එමගින් ද ගුණාත්මක දත්ත ලබාගන්නා ලදි. ලබාගත් දත්ත ප්‍රථමයෙන් තුලනය කිරීමෙනුත් දෙවනුව වර්ග කිරීමෙනුත් පසුව පොදු සංකල්ප මතු කර ගැනීමෙන් දත්ත විශ්ලේෂණ කාර්ය නිමා කරගැනීමෙන් මෙම අධ්‍යයනයේ නිගමන මතු කරගත හැකි විය.

බිරිඳගේ විදේශගත වීම නිසා සැමියාට ඇති වී තිබෙන ගැටළුකාරී බවත් ඒ නිසාම පවුල් සංස්ථාවට සිදුව ඇති ගැටළුකාරී බවත් හඳුනාගත හැකි විය. මෙම ගැටළුකාරී වාතාවරණය සෘජුවම දරුවන්ට බලපා ඇති අයුරු අනාවරණය විය . සැමියා මත් ද්‍රව්‍ය වලට, මත් පැනට ඇබ්බැහි වීම, ව්‍යභිචාරය, බිඳුණු පවුල් නිර්මාණය වැනි ගැටළු දරුවන්ට බලපා ඇති ආකාරය හඳුනාගත හැකි විය. විශේෂයෙන්ම දරුවන් බාලාපචාරවලට යොමුවීම, ඔවුන්ට අපචාර සිදුවීම, ඔවුන්ගේ අධ්‍යාපනය කඩාකප්පල් වීම පවුල තුළ මවගේ විදේශගත වීම නිසා දරුවන්ට සිදුව ඇති බරපතල හානිකර තත්වයන්ය. මෙසේ දරුවන්ට සිදුව ඇති අහිතකර බලපෑම මුළු මහත් සමාජයම වෙත ගැටළුකාරී බවක් උත්පාදනය කිරීමට ප්‍රබලම හේතුවක් වී ඇත. මේ නිසා සමාජය තුළට බාලාපචාරීන්, සොරුන්, මංකොල්ලකරුවන්, මිනීමරුවන්, අපරාධකරුවන්, ගණිකාවන්, මත් සොඬුන්, සුරා සොඬුන් බිහිවීම වළකාලිය නොහැකි තරමට උග්‍ර සමාජ ගැටළුවක් වී හමාරය.



අගුළු පද : 1. බිඳුණු පවුල් 2. අපචාරය 3. ව්‍යභිචාරය 4. මිනීමරුවන් 5. අපරාධකරුවන්

# Abstract

The problem we faced when conducting a sociological study relating to the effects on the families in Sri Lanka when Sri Lankan mothers went abroad for employment. To study the related causes of this problem, we had to select a study field and we selected Mallawapitiya Divisional Secretariat Division since the percentage of women employees' was high. The guardians of the children and the other children of the families of the mothers who went abroad contributed to provide information. To collect data we used a questionnaire and it was the basic foundation. And the statistical information was gathered using this system. We got this information confirmed by friendly interviews we conducted with the children of their families. One of the strategies we used to collect data was direct observation. And from that approach we could gather qualitative data by this method. We evaluated the data at first, and secondly categorized the data we gathered. We could arrive at decisions by finding common concepts and evaluating the data.

We identified the problems faced by the husbands due to their wives staying abroad and we further identified the problems created in the family units. We discovered that this problematic environment directly affected the children. We identified husbands misconduct, who became drug addicts, alcoholics etc. The grave and the most harmful circumstances faced by the children whose mothers are living abroad were child exploitation, child abuse and disrupting their education. The adverse effects caused to the children have created a number of complex problems which affected entire society. This problem resulted in producing child abusers, robbers, looters, murderers, criminals, prostitutes, drug addicts and alcoholics and disrupted families and adultery.

Keywords: 1. Disrupted families 2. Abuse 3. Misconduct 4. Murderers 5. Criminals